14 පිටුවෙන් (අදිසි)

සුනන්දගේ අත මත සිය දකුණත තබයි.

"මං හැමදාම ඔයාව විශ්වාස කරනවා සුනන්දයියා" ඇය සිතින් කියයි.

0000000000000

"හාම්පුතාට වඩා සැර දාන්නෙ කටු කන බල්ලො.." තිලිණ ගේ කෝපය රැඳුණ වදන් අයෝමා අසා සිටින්නේ සිනාසෙමින් ය.

"ගාඩ් එකේ අය හිතන්න ඇති ඔයා පිස්සෙක් කියලා.. පේන්නැද්ද ඇඳගෙන ඉන්න හැටි.. ඔයා නම් කැම්පස් එකේ හිටිය කාලෙ වගේමයි තිලිණ.. කිසිම වෙනසක් වෙලා නැහැ.."

ඇගේ වදන් නෑසුණා සේ ඔහු ඉවත බලා ගනියි..

"ඇත්තටම අයෝමා මේ විදිහට මුර බල්ලො වට කරගෙන ගෙවන ජීවිතෙන් සතුටක් ලැබෙනවද ඔයාට..?"

අයෝමා සිනාසෙයි..

"ඒක තේරුම් ගන්න ඒක විඳලාම බලන්න ඕනෙ සහෝදරයා.. මේක තමයි කෙනෙකුට ලබන්න පුලුවන් ඉහළම වින්දනය.. මං කලින් දවසකත් තමුසෙට කිව්වෙ.. බලය උරගා බැලීම.. බලය සමගින් සෙල්ලම් කිරීම.."

"විකාර.. තමුසෙට පිස්සු.. "

"හා හා.. හෙමින් කතා කරන්න සහෝදරයා.. කාටවත් ඇහුණොත් ඔයාව බෙල්ලෙන් අල්ලලා එලියට දායි.. දන්නවනෙ.. ඔයාමනෙ කිව්වෙ අර කටු කන බල්ලො ගැන කතාව.. ඒ කතාව හරියටම හරි බං.. මං කිව්වොත් කාගෙ හරි පිටට තට්ටුවක් දාපල්ලා කියලා උං ඒ මිනිහගෙ බෙල්ලත් ගලවලා තමයි පස්ස බලන්නෙ.. මොකටද දන්නවද..? හාම්පුතා සතුටට පත් කරන්න.. බය පක්ෂපාත බව වැඩිපුර ප්‍රදර්ශනය කළාම හාම්පුතාගෙන් විශේෂ වරප්‍රසාද ලැබෙන බව උං අද්දැකීමෙන්ම දන්නවා.."

"ඔය තරං පහත් තත්වෙකට වැටෙන්න එපා අයෝ.. මට උඹ ගැන දුකයි.."

"මං උඹට කැමතියි.. මං ළඟ ඉන්න කිසිම මිනිහෙකුට මගේ මූණ බලාගෙන ඔහොම කෙලින් කතා කරන්න ආත්ම ශක්තියක් නැහැ.. උං ඔක්කොම එහෙයියො... උඹ දන්නවද..? මං මේ යන ගමන යන්නෙ හොඳ අවබෝධයකින්.. හොරිකඩකම්.. පාවාදීම්.. බෙලි කැපීම්.. මේ හැම දෙයක්ම මං හොඳින්ම දන්නවා.. හොඳට ඇස් ඇරගෙන මං මේ යන්නෙ.. මේක දැනුවත්ව යන ගමනක්.. බලපං මේ ඔෆිස් එකෙන් එළියෙ කොයි තරම් මිනිස්සු පෝලිමේ ඉන්නවද මාව හමුවෙලා එක වචනයක් කතා කරන්න.. මං ඒ මිනිස්සුන්ගෙ නායිකාව වෙනවා.. ඒ නායකත්වය උං පිළිගන්නවා.. ඒ පිළිගැනීම විඳගන්න මං කැමතියි.."

"උඹට රණසිංහ ගැන දුක නැද්ද..?"

"ඇයි..?"

"ඒ මිනිහව උඹල අමාරුවෙ දම්මා.. නීතිය ඉදිරියේ ඔප්පු කරන්න බැරි වුණාත් රටේ මිනිස්සු ඒක තැන තැන කතා කරනවා.."

"අයේෂගේ බඩට බබෙක් දුන්නෙ මං නෙවෙයිනෙ.."

"රණසිංහගේ දුර්වල තැන අල්ලලා උඹලා තුරුම්පුව ගැහුවා.." තිලිණ අසුනින් නැගී සිටියි.. "..මං යනවා අයෝ.. උඹත් එක්ක කතා කරනකොට මගේ ඇඟේ ලේ පිච්චෙනවා.. මට ගුරු පවීත්වීමක් ලැබුණා.. අම්පාරට.. ඒක කියලා යන්නයි මං ආවෙ.."

"ඒක හොඳයි.. පත්වීම කොළඹට හරි ගමට හරි හදා ගන්න ඕනෙ නං කියපං.. මං කරලා දෙන්නම්.."

"ස්තූතියි මැඩම්.. අවශ්‍ය නැහැ.. මං කැමතියි ඒ දුප්පත් ළමයින්ට හොඳ ගුරුවරයෙක් වෙන්න.. හැමෝම කොළඹ අවාම කවුද උන්ට අකුරක් කියලා දෙන්නෙ.. මං යන්නං.."

කාමරයෙන් දොර අසළදී තිලිණ නැවත හැරී අයෝමා දෙස බලයි.

"කොළඹ ආවාම ඇවිත් මාව හමුවෙයං.. ප්‍රතිපත්තිගරුක දේශපාලනෙන් හෙම්බත්වුණ දාට ඒකත් මට කියපං.. මං උදව්වක් කරන්නම්.." ඕ අත ඔසවා ඔහුට සමු දෙයි.

**"දරුවෙකුගෙ අනාගතේ ගැන හැම අම්ම කෙනෙකුගෙම හිතේ මහමෙරක් තරම් බලාපොරොත්තු තියෙනවා පුතේ.." අම්මා ඇඟිලි තුඩින් පහන් තිර නිසි ලෙස සකසන අතර කියයි. ".. මගේ හිතේ මහා ගින්දරක් තිබුණා ලොකු එකා ගැන.. දැන් ඒ ගින්දර නිවිලා.. හිතට සැහැල්ලුයි.. දැන් බර තියෙන්නෙ උඹ ගැන.. උඹත් මේ අපායෙන් ගැලවෙන්න ඕනෙ.. පඬුරක් ගැට ගහලා බාරයක් වුණේ අවිශ්වාසයකට නෙවෙයි.. උඹට මේ හදිසියෙ නුවණ දෙන්න කාටවත් බැහැ.. උඹ විභාගෙන් පාස් වෙනව කියල මට විශ්වාසයි.... ඒකට උඹට ශක්තිය දෙන්න කියලයි මම ඉල්ලුවෙ.."**

මෙතෙක් වේලා ඇගේ දෑසේ තිබූ සැහැල්ලු බැල්ම නිවී ඇති සැටියක් ඔහුට පෙනෙයි. ඒ වෙනුවට ආරෝපනය වී ඇති බැරෑරුම් බැල්ම ඔහු හොඳින් දකියි. සමහර විට මේ තමා ඇය හමුවන අවසන් වතාව විය හැකි බව ඔහු දනියි.

00000

තිසල් විසින් පහත් කර දෙන ලද බෝ අත්තේ සුදු රෙදි පටියක දැවටූ පඬුර ගැට ගසන පොඩි නෝනා ගේ මුහුණ සැඳෑ ආලෝකය වැටී දීප්තිමත්ව පෙනෙයි. මහත් ශ්‍රද්ධාවකින් යමක් මුමුණමින් ඉතා සීරුවෙන් සිය කාර්යයෙහි නිරත වන අම්මා දෙස බලා සිටිනා තිසල් ගේ සිත ඈ කෙරෙහි හටගත් දයාවෙන් පිරී යයි. මේ පඬුරු ගැට ගැසෙන්නේ තමා වෙනුවෙනි.

"දැන් ඉතින් අම්ම මොකක් හිතාගෙනද පඬුර ගැට ගැහුවෙ...?" තිසල් බෝ අත්ත සීරුවෙන් අතහරින අතර අසයි. තමන්ගේ හිසට අඩි කීපයක් ඉහළින් නැවතෙන බෝ අත්තේ ගැට ගැසී ඇති සිය ගණනක් පඬුරු අතරින් අලුත්ම රෙදි කඩකින් දැවටී ගත් තමාගේ පඬුර ඔහුට පහසුවෙන් හඳුනාගත හැකි ය.

ඇසේ නැගී කඳුලු බිඳ පිටි අත්ලෙන් පිසදා ගන්නා අම්මා අලුත්ම තිර දැමූ පහන් වලට බෝතලයෙන් තෙල් වත් කරයි.

"දරුවෙකුගෙ අනාගතේ ගැන හැම අම්ම කෙනෙකුගෙම හිතේ මහමෙරක් තරම් බලාපොරොත්තු තියෙනවා පුතේ.." අම්මා ඇඟිලි තුඩින් පහන් තිර නිසි ලෙස සකසන අතර කියයි. ".. මගේ හිතේ මහා ගින්දරක් තිබුණා ලොකු එකා ගැන.. දැන් ඒ ගින්දර නිවිලා.. හිතට සැහැල්ලුයි.. දැන් බර තියෙන්නෙ උඹ ගැන.. උඹත් මේ අපායෙන් ගැලවෙන්න ඕනෙ.. පඬුරක් ගැට ගහලා බාරයක් වුණේ අවිශ්වාසයකට නෙවෙයි.. උඹට මේ හදිසියෙ නුවණ දෙන්න කාටවත් බැහැ.. උඹ විභාගෙන් පාස් වෙනව කියල මට විශ්වාසයි.... ඒකට උඹට ශක්තිය දෙන්න කියලයි මම ඉල්ලුවෙ.."

"අම්මගෙ කතාව හරි.." බෝ මැඩ අබියසට ඇවිද එන පොඩි හාමුදුරුවෝ කියති. ".. "

"හිත සැහැල්ලුවෙන් විබාගෙ ලියන්න.. තිසල් පාස් වෙනවා.."

බොහෝ කැප වීමෙන් පොත පතෙහි වැඩ කරන තිසල් අසමර්ථ නොවනු ඇති බව පොඩි හාමුදුරුවන් ගේ විශ්වාසයයි.

"මං කොහොම හරි කැම්පස් යනවා අපේ හාමුදුරුවනේ.." තිසල් වචන වලට පෙරළන්නේ ඒ විශ්වාසයයි. ".. උපාදියත් ගන්නවා.."

"ඊට පස්සෙ...?"

"ඊට පස්සෙ...!!"

සඳ එළිය ඇලේ දිය මත වැටී ඇත . කලු පැහැ වතුර මත සඳේ ප්‍රතිබිම්බය පැහැදිළිව දිස් වෙයි. වරින් වර නැගෙන දිය රැළිති නිසා සඳ ප්‍රතිබිම්බය කැබලි වලට කැඩෙමින් නැවත එක්වෙමින් ඇත.

සෝමදාස ගේ මාලු ලෑල්ල අසළ බල්ලන් රොත්තක් පොරකමින් සිටිති. අසළ ලෑල්ලක් මත අඩ නින්දේ සිටින මිනිසා උන් එළවා දමන්නට කෑ ගසයි. සමරේ ගේ ත්‍රී වීලරය දුම් රොටු පිට කරමින් තිසල් පසු කරමින් යයි. එහි පිටුපස අසුනේ සිටි පමණට වඩා වත්සුණු තවරා ගත් ගැහැණිය තිසල් දනියි. අද ඇයට රාජකාරියට යන්නට පාමා වී ඇතුවා විය හැකි ය.

බොහෝ නිවෙස් වලින් පිටවන කැසට් සංගීතය පරදවා බීමත් මිනිසකු ගේ ගෝරනාඩුව ඈතින් ඇසෙයි. සේදරයා විය යුතුයයි තිසල් අනුමාන කරයි. නිසැකව ම තවත් ටික වේලාවකදී ඔහුගේ ගෝරනාඩුව මහා රණ්ඩුවක් වනු ඇත.

පාරේ ඈත කෙළවරේ කොළු කුරුට්ටෝ පිරී සිටිති. සෙල්ලමෙන් පසු දහඩිය වැකුණ සිරුරින් යුතු උන්ට ගෙවල් වලට යන්නට වත් කල්පනාවක් නැති සේ ය.

වත්තේ සියලුම දේ වෙනදා ලෙසින් ම මේ සවසත් සිදුවෙමින් පවතියි. කිසිවක් අබමල් රේණුවක තරමින් වත් වෙනස් වී නැත. හෙටත් මේ සියල්ල මේ ලෙසින්ම සිදුවන බව තිසල් දනියි. මේ චක්‍රය නවත්වන ක්‍රමයක් කොතැනක හෝ තිබිය යුතු ය. ඒ කොතැනද යන්න හෝ නවතින්නේ කෙළෙසද යන්න හෝ ගැන වැටහීමක් තිසල්ට නැත.

පොඩි හාමුදුරුවන් සමග කළ අවසන් කතාව තිසල්ගේ මනසේ තවමත් ප්‍රතිවාදනය වෙයි. එය මහා වදයක් ලෙස ඔහුට දැනෙයි.

"මං කොහොම හරි කැම්පස් යනවා අපේ හාමුදුරුවනේ.... උපාදියත් ගන්නවා.."

"ඊට පස්සෙ...?"

"ඊට පස්සෙ...!!"

"ඊට පස්සෙ...!!"

"ඊට පස්සෙ...!!"

*සියලු ම අරමුණු හා සියලු ම අභිලාෂ ද සියලුම දොම්නස් හා සොම්නස් ද සියලු යහපත් දේ හා අයහපත් දේ ද යන මේ සියල්ලක්ම ලෝකය විය. සියල්ල එක්ව සිදුවීම් නදිය ජීවන සංගීතය විය - සිද්ධාර්ථ*

*අදිසි අවසානයි*


